# අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යාංශය
# ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE)
# 2025 අධ්‍යයන වර්ෂය සඳහා
# උසස් තාක්ෂණ ආයතනවලට සිසුන් බඳවා ගැනීම

2024 වර්ෂයේ හෝ ඊට පෙර අ.පො.ස (උසස් පෙළ) විභාගය සාර්ථක ලෙස සම්පූර්ණ කළ අයදුම්කරුවන්ගෙන්, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය විසින් පවත්වනු ලබන උසස් ජාතික ඩිප්ලෝමා (HND) පාඨමාලා සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ.

**අයදුම්කරන පිළිවෙල**

අයදුම්කරුවන් ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ, උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා සඳහා **apply.sliate.ac.lk** වෙබ් අඩවිය මගින් පමණක් මාර්ගගතව අයදුම්කළ යුතුය. වෙනත් ඕනෑම ආකාරයකින් අයදුම් කිරීම පිළිගනු නොලැබේ. අයදුම්කරුවන් අන්තර්ජාලය හරහා උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා සඳහා අයදුම් කිරීමේදී මෙන්ම අන්තර්ජාලය හරහා තෝරාගත් උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා සඳහා ලියාපදිංචි වීමේදී ඇතුළත් වීමේ මාර්ගෝපදේශ කියවා තේරුම් ගත යුතු අතර, එහි ඇති නීති රීති සහ රෙගුලාසි අනුගමනය කළ යුතුය. ඇතුළත් වීමේ මාර්ගෝපදේශය මාර්ගගත අයදුම්පත සමඟ ලබා ගත හැක.

ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය විසින් පහත වගුවේ පරිදි උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා කාණ්ඩ දෙකක් යටතේ පිරිනමයි.

| | |
|---|---|
| Z ලකුණු මත පදනම් වූ SLIATE අධ්‍යයන පාඨමාලා<br>**කාණ්ඩ - 1** | HNDA, HNDBA, HNDBF, HNDE (CIVIL), HNDE (MECHANICAL), HNDE (ELECTRICAL & ELECTRONICS)/ HNDQS, HNDBSE, HNDT(AGRICULTURE.), HNDFT |
| ලකුණු දීමේ පටිපාටිය මත පදනම් වූ SLIATE අධ්‍යයන පාඨමාලා<br>**කාණ්ඩ - 2** | HND IN ENGLISH, HNDIT, HNDM, HNDPM, HNDTHM |

සුදුසුකම් ලත් අපේක්ෂකයින්ට Z අගය මත පදනම් වූ සහ ලකුණු දීමේ පටිපාටිය මත පදනම් වූ පාඨමාලා කාණ්ඩ දෙකෙන් උපරිම අවස්ථා 10 ක් දක්වා ඔවුන්ගේ ප්‍රමුඛතාවය මත පදනම්ව උසස් තාක්ෂණ ආයතන සහ උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා සංයෝජන තෝරාගත හැක.

උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා සඳහා වන ප්‍රවේශ සුදුසුකම් **"A"** කොටසේ සහ උසස් තාක්ෂණ ආයතන **(ATIs)** පිළිබඳ විස්තර **"B"** කොටසේ ඇතුලත් කර තිබේ.

සුදුසුකම් ඇති අපේක්ෂකයින්ට රු.1,000/= ක් ගෙවා උසස් තාක්ෂණ ආයතන වල උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා (උසස් තාක්ෂණ ආයතන සහ උසස් ජාතික ඩිප්ලෝමා සංයෝජන) උපරිම 10 ක් ඉහත කාණ්ඩ දෙකෙන්ම ඉල්ලුම් කළ හැක.

**අයදුම්පත් ගාස්තු සෘජුවම බැංකුවට ගෙවිය යුතුය. CDM යන්ත්‍ර මගින් සිදුකරන ගෙවීම් පිළිගනු නොලැබේ.**

**බැංකු ගෙවීම් කුවිතාන්සියේ ගනුදෙනු යොමු අංකය (TRN) මාර්ගගත අයදුම්පතහි සඳහන් කළ යුතුය. 2025 ජුලි 14 හෝ ඊට පෙර මහජන බැංකුව, හයිඩ් පාර්ක් ශාඛාව, කොළඹ 02 හි, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ ගිණුම් අංක 025-2-001-1-3397613 වෙත ගෙවීම් බැර කළ යුතුය. එම ශාඛාවෙන් හෝ ශ්‍රී ලංකාවේ ඕනෑම මහජන බැංකු ශාඛාවක් මගින් ගෙවීම් සිදුකළ හැකිය.**

**මාර්ගගත අයදුම්පත්‍රය තහවුරු කිරීමෙන් පසු, අයදුම්පත්‍රයේ පද්ධතිය මගින් උත්පාදිත මුද්‍රිත පිටපතක් ලබා ගන්න. ඉහත බාගත කරන ලද අයදුම්පතෙහි අත්සන් කළ අයදුම්පත සහ ගෙවීම් ලදුපත ඔබගේ ප්‍රථම කැමැත්ත සඳහන් කර ඇති උසස් තාක්‍ෂණ ආයතනයට ලියාපදිංචි තැපෑලෙන් යොමු කළයුතු වේ.**

මෙම ක්‍රියාවලිය තුළදී සහ ඉන්පසුව අයදුම්පතේ තත්ත්වය කුමක්දැයි අප වෙත ලබාදී ඇති විද්‍යුත් තැපැල් ලිපිනය මගින් හෝ ජංගම දුරකථන ඔස්සේ හෝ තැපැල් මගින් අයදුම්කරුට දන්වනු ලැබේ.

අයදුම්පත් භාරගනු ලබන අවසාන දිනය වන **2025 ජුලි 14** වන දිනෙන් පසුව ලැබෙන අයදුම්පත් කිසිදු හේතුවක් මත භාරගනු නොලැබේ.

**අවසාන දිනයෙන් පසුව, තෝරාගත් අයදුම්කරුවන්ට සති දෙකක් ඇතුළත පද්ධතිය හරහා තෝරාගත් උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා සඳහා ලියාපදිංචිය තහවුරු කරන ලෙස විද්‍යුත් තැපෑලෙන් / කෙටි පණිවිඩ සේවාව (SMS) මගින් දැනුම් දෙනු ලැබේ. ලබා දී ඇති කාල සීමාව තුළ අයදුම්කරු මාර්ගගත පද්ධතිය හරහා ලියාපදිංචිය තහවුරු නොකරන්නේ නම්, ඔහු/ඇය ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයෙ හි කිසිදු උසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලාවක් සඳහා නැවත සලකා බලනු නොලබන අතර, ඔහුගේ/ඇයගේ අයදුම් පත්‍රය අවලංගු වේ.**

**පාඨමාලා පවත්වනු ලබන ක්‍රමය**

- **පූර්ණ කාලීන පාඨමාලා**
- **අර්ධ කාලීන පාඨමාලා (සති අන්ත)**

**ඉගැන්වීමේ මාධ්‍ය - ඉංග්‍රීසි**

අර්ධ කාලීන පාඨමාලා අදාල ක්ෂේත්‍රයන්හි රැකියාවේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණක් පවත්වනු ලැබේ.

**පාඨමාලා ගාස්තු**

පූර්ණ කාලීන (Full-Time) පාඨමාලා ගාස්තු - නොමිලේ.

එක් අධ්‍යයන සමාසිකයක් වෙනුවෙන් අර්ධ කාලීන පාඨමාලා ගාස්තු පහත සඳහන් පරිදි වේ.

| | |
|---|---|
| උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව – **HNDA** | රු**. 17,000.00** |
| උසස් ජාතික ඉංග්‍රීසි ඩිප්ලෝමාව – **HND in English** | රු**. 17,000.00** |
| උසස් ජාතික තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාව – **HNDIT** | රු**. 30,000.00** |

උසස් ජාතික ව්‍යාපෘති කළමනාකරණය ඩිප්ලෝමාව – **HNDPM** රු. **20,000.00**
අර්ධකාලීන පාඨමාලා සඳහා ආපසු ගෙවනු ලබන මුදල් තැන්පතු ගාස්තුව රු. **10,000.00**

**ලියාපදිංචිය :**

ලියාපදිංචිය සිදුකරන අවස්ථාවේ දී අවශ්‍ය අධ්‍යාපනික සහ අනෙකුත් අවශ්‍ය ලියකියවිලි වල මුල්පිටපත් සහ සහතික කළ පිටපත් ඉදිරිපත් කළයුතුය.

**නේවාසිකාගාර පහසුකම්**

පහත සඳහන් උසස් තාක්ෂණ ආයතනයන් හි ඉල්ලීම මත පමණක් පූර්ණ කාලීන සිසුන් සීමිත සංඛ්‍යාවක් සඳහා නේවාසිකාගාර පහසුකම් සපයනු ලැබේ.

- දෙහිවල සහ ගම්පහ උසස් තාක්ෂණ ආයතන - සිසුවියන් සඳහා පමණක්
- අම්පාර සහ කොළඹ උසස් තාක්ෂණ ආයතන - සිසුන් සහ සිසුවියන් සඳහා

## "A" කොටස

**උසස් ජාතික ඩිප්ලෝමා (HND) පාඨමාලා සඳහා ප්‍රවේශ සුදුසුකම්**

### **01.** උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව (HNDA)

### 1.1 පූර්ණ කාලීන - වසර 4 ක්

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

**වාණිජ විෂය ධාරාව යටතේ ගිණුම්කරණ විෂය** ද සහිතව අ.පො.ස (උ/පෙළ) විභාගය එකවර සමත්වී තිබීම.

**සහ**

අ.පො.ස (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි සහ ගණිතය විෂය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

### 1.2 අර්ධ කාලීන - වසර 4 ක්

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(i.) **වාණිජ විෂය ධාරාව යටතේ ගිණුම්කරණ විෂය** ද සහිතව අ.පො.ස (උ/පෙළ) විභාගය එකවර සමත්වී තිබීම.

**සහ**

අ.පො.ස (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි සහ ගණිතය විෂය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.
.

**සහ**

අයදුම්කරු අදාල ක්ෂේත්‍රයේ රාජ්‍ය ආයතනයක/රාජ්‍ය ව්‍යවසායක/පිළිගත් සමාගමක හෝ ස්වයං රැකියාවක (ව්‍යවසායකයෙකු) නිරතව සිටීම. සම්මුඛ පරීක්ෂණයේදී නීතිමය ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

**හෝ**

ii) අ.පො.ස (උ/පෙළ) විභාගය එකවර සමත් වීම.

**සහ**

කාර්මික අධ්‍යාපන සහ පුහුණු කිරීමේ දෙපාර්තමේන්තුව (DTET) විසින් පවත්වනු ලබන පහත සඳහන් ඇති ඕනෑම සහතික පත්‍ර පාඨමාලාවක් සම්පූර්ණ කර තිබීම.

A. ගණකාධිකරණ ක්ෂේත්‍රයේ උසස් ජාතික ඩිප්ලෝමාව.
B. ගණක ශිල්පය පිළිබඳ ජාතික සහතිකය.
C. ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ජාතික සහතිකය.
D. ගණකාධිකරණය පිළිබඳ ජාතික සහතිකය.

**සහ**

අ.පො.ස (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි සහ ගණිතය විෂය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**සහ**

අයදුම්කරු අදාල ක්ෂේත්‍රයේ රාජ්‍ය ආයතනයක/රාජ්‍ය ව්‍යවසායක/පිළිගත් සමාගමක හෝ ස්වයං රැකියාවක (ව්‍යවසායකයෙකු) නිරතව සිටීම. සම්මුඛ පරීක්ෂණයේ දී නීතිමය ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

**සටහන 1:**

පහත සඳහන් සුදුසුකම් එකක් හෝ කිහිපයක් ඇති **වාණිජ විෂය ධාරාවේ** ඕනෑම උසස් ජාතික ඩිප්ලෝමා අර්ධ-කාලීන අයදුම්කරුවෙකු අනෙකුත් ප්‍රවේශ අවශ්‍යතා සපුරාලන්නේ නම් සහ උසස් තාක්ෂණ ආයතන වල ධාරිතාව තිබේ නම්, පළමු වසරෙන් නිදහස් කර දෙවන වසරට බඳවා ගනු ලැබේ.

i. SLIATE විසින් පවත්වනු ලබන ව්‍යාපාර පරිපාලනය/ ව්‍යාපාර මූල්‍ය පිළිබඳ උසස් ජාති ඩිප්ලෝමාව සහ ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ජාතික ඩිප්ලෝමාව සම්පූර්ණ කිරීම.

ii. ළමනාකරණ ක්ෂේත්‍රය පිළිබඳ උපාධියක් තිබීම.

iii. ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් පවත්වනු ලබන ව්‍යාපාර මට්ටම I සහ II හෝ විධායක මට්ටම හෝ CAB I සහ CAB II හෝ පදනම් සහ අන්තර්මාධ්‍ය මට්ටම හෝ බලපත්‍රලාභී I සහ II) සම්පූර්ණ කිරීම.

iv. වරලත් කළමනාකරණ ගණකාධිකරණ ආයතනය (CIMA – UK) I කොටස සහ II කොටස සම්පූර්ණ කිරීම.

v. සහතිකලත් වරලත් ගණකාධිකරණ ආයතනය (ACCA-UK) I කොටස සහ II කොටස සම්පූර්ණ කිරීම.

vi. ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ (AAT) සම්පූර්ණ කිරීම.

vii. සහතිකලත් කළමනාකරණ ගණකාධිකරණ ආයතනය (CMA-Sri Lanka) විසින් පවත්වනු ලබන ආශ්‍රිත සහතිකලත් කළමනාකරණ ගණකාධිකාරීන්ගේ විභාගය (ACMA) සමත්ව තිබීම.

සටහන **2:**

**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 46/90 ප්‍රකාරව, බඳවා ගැනීමේ පටිපාටියන්හි දී, උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා පාඨමාලාව, විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව යටතේ ලියාපදිංචි, පිළිගත් විශ්ව විද්‍යාලයක වාණිජවේදී උපාධි සාමාන්‍ය සාමාර්ථයකට විකල්ප අධ්‍යාපනික සුදුසුකමක් ලෙස පිළිගනු ලැබේ.**

**02.** **උසස් ජාතික ව්‍යාපාර පරිපාලන ඩිප්ලෝමාව** (HNDBA)
**පූර්ණ කාලීන - වසර** 2 ½ **ක්**

**03.** **උසස් ජාතික ව්‍යාපාර මූල්‍ය ඩිප්ලෝමාව (**HNDBF)
**පූර්ණ කාලීන -** 2 ½ **ක්**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

**වාණිජ විෂය ධාරාව** යටතේ එකවර අ.පො.ස (උ/පෙළ) විභාගය සමත් වී තිබීම.

**සහ**

අ.පො.ස (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි සහ ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබාතිබීම.

**04.** **උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (සිවිල්)**
HNDE (Civil) **- පූර්ණ කාලීන - වසර 3** ½ **ක්**

**05.** **උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (විදුලි හා විද්‍යුත් )**
HNDE (Electrical and Electronics) **- පූර්ණ කාලීන - වසර 3** ½ **ක්**

**06.** **උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (යාන්ත්‍රික)**HNDE (Mechanical)
**පූර්ණ කාලීන - වසර 3** ½ **ක්**

**07.** **උසස් ජාතික ප්‍රමාණ සමීක්ෂණ ඩිප්ලෝමාව** HNDQS
**පූර්ණ කාලීන - වසර 2** ½ **ක්**

**08.** **උසස් ජාතික ගොඩනැගිලි සේවා ඉංජිනේරු ඩිප්ලෝමාව** HNDBSE
**පූර්ණ කාලීන - වසර 3** ½ **ක්**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

**භෞතික විද්‍යා විෂය ධාරාවෙන්** එකවර අ.පො.ස (උ.පෙළ) විභාගය සමත් වී තිබීම.
(රසායන විද්‍යාව, භෞතික විද්‍යාව සහ සංයුක්ත ගණිතය)

**සහ**

අ.පො.ස (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි සහ ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

## 09. උසස් ජාතික ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව (HND in English)

### 9.1 පූර්ණ කාලීන - වසර 2 ½ යි.

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(a) **ඕනෑම විෂය ධාරාවකින්** එකවර අ.පො.ස. (උ/පෙළ) විභාගය සමත් වී තිබීම.
(සාමාන්‍ය ඉංග්‍රීසි ප්‍රධාන විෂයයන් තුනෙන් එකක් ලෙස නොසැලකේ.)

**සහ**

(b) අ.පො.ස (සා/පෙළ) විභාගයේදී ඉංග්‍රීසි විෂය සඳහා සම්මාන සාමාර්ථයක් සහ ගණිතය විෂය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබාතිබීම.

**හෝ**

අ.පො.ස (සා/පෙළ) විභාගයේදී ඉංග්‍රීසි සාහිත්‍ය විෂය සඳහා සහ ගණිතය විෂය සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබාතිබීම.

### 9.2 අර්ධ කාලීන - වසර 2½ යි.

9.1 හි ඉහත සුදුසුකම් වලට අමතරව, අයදුම්කරු අදාල ක්ෂේත්‍රයේ රජයේ ආයතනයක / රාජ්‍ය ව්‍යවසායක / පිළිගත් ආයතනයක හෝ ස්වයං රැකියාවක නියුක්ත (ව්‍යවසායකයෙකුව) නිරතව සිටීම. සම්මුඛ පරීක්ෂණයේ දී නීතිමය ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

## 10. උසස් ජාතික ආහාර තාක්ෂණ ඩිප්ලෝමාව (HNDFT)

**පූර්ණ කාලීන - වසර 2½ යි.**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

**ජීව විද්‍යාව හෝ භෞතික විද්‍යා විෂය ධාරාවෙන්** එකවර අ.පො.ස (උ/පෙළ) විභාගය සමත් වී තිබීම.

**සහ**

අ.පො.ස (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි සහ ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**11.** **උසස් ජාතික තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාව** (HNDIT)

11.1 **පූර්ණ කාලීන - වසර 2½ යි.**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

**ඕනෑම විෂය ධාරාවකින්** එකවර අ.පො.ස (උ/පෙළ) විභාගය සමත් වී තිබීම.

**සහ**

අ.පො.ස (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි සහ ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**11.2 අර්ධ කාලීන - වසර 2½ යි.**

**11**.1 හි ඉහත සුදුසුකම් වලට අමතරව, අයදුම්කරු අදාල ක්ෂේත්‍රයේ රජයේ ආයතනයක / රාජ්‍ය ව්‍යවසායක / පිළිගත් ආයතනයක හෝ ස්වයං රැකියාවක (ව්‍යවසායකයෙකුව) නිරතව සිටීම. සම්මුඛ පරීක්ෂණයේ දී නීතිමය ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

**12.** **උසස් ජාතික කළමනාකරණ ඩිප්ලෝමාව** (HNDM)

**පූර්ණ කාලීන - වසර 3 යි**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(i.) **ඕනෑම විෂය ධාරාවකින්** එකවර අ.පො.ස (උ/පෙළ) විභාගය සමත්වී තිබීම.

**සහ**

අ.පො.ස (සා/පෙළ) විභාගයේ ඉංග්‍රීසි හා ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබා තිබීම.

**හෝ**

**(ii)** කාර්මික අධ්‍යාපන සහ පුහුණු දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන ගිණුම්කරණ කාර්මික ශිල්පීන් සඳහා වන ජාතික සහතිකය හෝ ව්‍යාපාර අධ්‍යයනය පිළිබඳ ජාතික සහතිකය (රාජ්‍ය පරිපාලනය / අලෙවිකරණය).

**සහ**

අ.පො.ස (සා/පෙළ) විභාගයේ ඉංග්‍රීසි හා ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබා තිබීම.

**13.** **උසස් ජාතික ව්‍යාපෘති කළමනාකරණ ඩිප්ලෝමාව** (HNDPM)

**13.1 පූර්ණ කාලීන - වසර 2½ යි.**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

**ඕනෑම විෂය ධාරාවකින්** එකවරක දී අ.පො.ස (උ/පෙළ) විභාගය සමත් වී තිබීම.

**සහ**

අ.පො.ස (සා/පෙළ) විභාගයේ ඉංග්‍රීසි හා ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබා තිබීම.

13.2 **අර්ධ කාලීන - වසර 2½ යි.**

**13**.1 හි ඉහත සුදුසුකම් වලට අමතරව, අයදුම්කරු අදාල ක්ෂේත්‍රයේ රජයේ ආයතනයක / රාජ්‍ය ව්‍යවසායක / පිළිගත් ආයතනයක හෝ ස්වයං රැකියාවක (ව්‍යවසායකයෙකුව) නිරතව සිටීම. සම්මුඛ පරීක්ෂණයේ දී නීතිමය ලියකියවිලි ඉදිරිපත් කළ යුතුය.

**14. උසස් ජාතික තාක්ෂණ (කෘෂිකර්ම) ඩිප්ලෝමා පාඨමාලාව** (HNDT – Agriculture)
**පූර්ණ කාලීන - වසර 3 යි.**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

(i.) **ජීව විද්‍යාව විෂය ධාරාවෙන්** එකවර අ.පො.ස (උ/පෙළ) විභාගය සමත්වී තිබීම.
(ජීව විද්‍යාව සහ රසයන විද්‍යාව සමඟ භෞතික විද්‍යාව හෝ කෘෂිකර්මය විෂයයන් ඇතුලත්ව)

**සහ**

අ.පො.ස (සා/පෙළ) විභාගයේ ඉංග්‍රීසි හා ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථ ලබා තිබීම.

**හෝ**

(ii.) **ජෛව පද්ධති තාක්ෂණවේදය, තාක්ෂණවේදය සඳහා විද්‍යාව සහ කෘෂිකර්මය යන විෂයයන් ඇතුලත්ව, ජෛව පද්ධති තාක්ෂණවේදය විෂය ධාරාවෙන්** එකවර අ.පො.ස (උ/පෙළ) විභාගය සමත්වී තිබීම.

**සහ**

අ.පො.ස (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි හා ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

**15. උසස් ජාතික සංචාරක හා සත්කාරක කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව** (HNDTHM)
**පූර්ණ කාලීන - වසර 3 යි.**

අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

ඕනෑම විෂය ධාරාවකින් අ.පො.ස (උ/පෙළ) විභාගය සමත් වී තිබීම.

**සහ**

අ.පො.ස (සා/පෙළ) විභාගයේ දී ඉංග්‍රීසි හා ගණිතය විෂයයන් සඳහා සාමාන්‍ය සාමාර්ථයක් ලබා තිබීම.

## "B" කොටස

### උසස් තාක්ෂණ ආයතනවල (ATIs) නම්, ලිපිනයන්, දුරකථන අංක සහ උසස් ජාතික ඩිප්ලෝමා (HND) පාඨමාලා [පූර්ණ කාලීන (FT) සහ අර්ධ කාලීන (PT) ]

| අංකය | උසස් තාක්ෂණ ආයතනයේ නම | ලිපිනය | දුරකථන අංක | පවත්වනු ලබන පාඨමාලා |
|---|---|---|---|---|
| 01 | හාඩි උසස් තාක්ෂණ ආයතනය, අම්පාර | මහාචාර්ය එවන් ඒ හාඩි මාවත, අම්පාර. | 063-2222056<br>063-2223035 | HNDT (Agriculture)(FT), HNDA (FT), HNDM(FT), HNDIT (FT), HNDTHM(FT), HND in English (FT), HNDA (PT), HND in English (PT), HNDIT (PT) |
| 02 | උසස් තාක්ෂණ ආයතනය, අනුරාධපුරය. | අක්කර 111, අනුලා මාවත, පන්ඩුලගම, අනුරාධපුරය. | 025-2234417 | HNDIT(FT), HNDA (FT), HND in English (FT), HNDIT(PT) HNDA (PT), HND in English (PT) |
| 03 | උසස් තාක්ෂණ ආයතනය, බදුල්ල. | ග්‍රීන්ලන්ඩ් ඩ්‍රයිව්, බදුල්ල. | 055-2230218<br>055-2223818 | HNDIT (FT), HNDA (FT), HNDM(FT), HND in English (FT), HNDTHM(FT), HNDIT (PT), HNDA (PT),HND in English (PT) |
| 04 | උසස් තාක්ෂණ ආයතනය, මඩකලපුව. | කෙලින් වීදිය, කෝවිල් කුලම්, නැගෙනහිර, ආරයම්පති, මඩකලපුව. | 065-2247519<br>065-2247470 | HNDIT (FT), HNDA (FT), HND in English (FT), HNDA (PT), HND in English (PT), HNDIT(PT) |
| 05 | උසස් තාක්ෂණ ආයතනය, කොළඹ. | අංක 42, රොද්‍රිගු පෙදෙස, කොළඹ- 15. | 011-2521152<br>011-2521282 | HNDE (Civil)(FT),HNDE(Mechanical)(FT), HNDE (Electrical & Electronics)(FT) HNDQS(FT), HNDBSE(FT) |
| 06 | උසස් තාක්ෂණ ආයතනය, දෙහිවල. | අංක 51, වෛද්‍ය පාර, දෙහිවල | 011-2738349 | HNDIT (FT), HNDA (FT), HNDM (FT), HNDBA (FT), HND in English (FT), HNDBF(FT), HNDTHM(FT), HNDA (PT), HND in English (PT), |
| 07 | උසස් තාක්ෂණ ආයතනය, ගාල්ල. | සිරිධම්ම මාවත, ලබුදූව, අක්මීමණ, ගාල්ල. | 091-2246179 | HNDE (Civil)(FT),HNDE(Mechanical)(FT), HNDE (Electrical & Electronics)(FT) HNDQS(FT), HNDIT (FT), HNDT(Agriculture)(FT), HNDA (FT), HNDM(FT), HNDTHM(FT), HNDBA(FT), HND in English (FT), HNDA (PT), HNDIT (PT), HND in English (PT) |
| 08 | උසස් තාක්ෂණ ආයතනය, ගම්පහ. | නයිවල, එස්සැල්ල, වේයන්ගොඩ. | 033-2287519<br>033-2292544 | HNDT (Agriculture) (FT), HNDIT (FT), HNDFT(FT),HNDA (FT), HNDA (PT), HNDIT (PT), HND in English(PT) |
| 09 | උසස් තාක්ෂණ ආයතනය, යාපනය. | අංක 665/2, වෙරළ පාර, ගුරුනගර්, යාපනය. | 021-2222595<br>021-2229803 | HNDE (Civil)(FT) , HNDE (Electrical & Electronics)(FT), HNDA (FT), HND in English (FT), HNDQS(FT), HNDM (FT), HNDIT (FT), HNDIT (PT), HNDA (PT) , HND in English (PT), HNDPM (PT) |

| | | | | |
|---|---|---|---|---|
| 10 | උසස් තාක්ෂණ ආයතනය, මහනුවර. | අංක. 16, කැප්පෙටිපොළ මාවත, මහනුවර. | 081-2232097<br>081-2226644 | HNDIT (FT), HNDA (FT), HNDM(FT), HNDBA(FT), HND in English (FT), HNDTHM (FT),<br>HNDA (PT),HND in English (PT), HNDIT (PT) |
| 11 | උසස් තාක්ෂණ ආයතනය, කෑගල්ල. | බණ්ඩාරනායක මාවත, කෑගල්ල. | 035-2221297<br>035-2221713 | HNDIT(FT), HNDA(FT), HND in English(FT), HNDPM(FT)<br>HNDA (PT), HND in English (PT) |
| 12 | උසස් තාක්ෂණ ආයතනය, කුරුණෑගල. | 22/1, විල්ගොඩ පාර, කුරුණෑගල. | 037-2229583<br>037-2224911 | HNDIT(FT),HNDA(FT),HNDM(FT),<br>HND in English (FT), HNDTHM(FT)<br>HNDIT (PT), HNDA (PT), HND in English (PT) |
| 13 | උසස් තාක්ෂණ ආයතනය, මන්නාරම. | උයිලන්කුලම මන්නාරම. | 023-3122555<br>076-7966111 | HND in English (FT),<br>HNDIT (FT) |
| 14 | උසස් තාක්ෂණ ආයතනය, නාවලපිටිය. | හයින්ෆෝඩ් වත්ත මානාකන්ද නාවලපිටිය. | 077-6594248 | HNDTHM(FT), HNDM(FT), HNDBF (FT)<br>HND in English (FT), HNDIT (FT),<br>HND in English (PT)<br>HNDIT (PT) |
| 15 | උසස් තාක්ෂණ ආයතනය, රත්නපුරය. | නව නගරය, රත්නපුරය. | 045-2231492<br>045-2231493 | HNDIT(FT),HNDA(FT),<br>HNDA (PT), HND in English (FT),<br>HND in English (PT) |
| 16 | උසස් තාක්ෂණ ආයතනය, සමන්තුරය. | උසස් තාක්ෂණ ආයතන මාවත, සමන්තුරය. | 067-2261304 | HNDIT (FT),HNDA (FT), HND in English (FT), HNDM (FT)<br>HNDIT (PT),HNDA (PT), HND in English (PT) |
| 17 | උසස් තාක්ෂණ ආයතනය, තංගල්ල. | යාය වත්ත, නොටොල්පිටිය, තංගල්ල. | 047-2241845<br>047-2241846 | HNDIT (FT), HNDA (FT), HND in English (FT) |
| 18 | උසස් තාක්ෂණ ආයතනය, ත්‍රිකුණාමලය. | කන්නියා පාර, වරෝතය නගර්, ත්‍රිකුණාමලය. | 026-2223232 | HNDIT (FT), HNDA (FT), HND in English (FT),<br>HNDIT (PT), HNDA (PT), HND in English (PT) |
| 19 | උසස් තාක්ෂණ ආයතනය, වවුනියාව. | A9 පාර වෙප්පන්තුලම ඔමන්තෙයි, වවුනියාව. | 024-2052733<br>077-6162010 | HNDA (FT), HND in English (FT),<br>HNDA (PT), HND in English (PT), HNDIT (PT),<br>HNDIT (FT) |

**සටහන:**

01. අයදුම්කරු අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනයට පෙර අවශ්‍ය සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය.

02. ශ්‍රී ලංකා උසස් තාක්‍ෂණ අධ්‍යාපන ආයතනය (SLIATE) යටතේ පවතින උසස් තාක්‍ෂණ ආයතන මගින් පවත්වනු ලබන වසර තුනක් හෝ ඊට වැඩි කාලයක් සහිත පූර්ණකාලින උසස් ජාතික ඩිප්ලෝමා (HND) පාඨමාලාවක් හැදෑරීම සඳහා ලියාපදිංචි වී සිටි / සිටින සිසුන්, 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනත (වරින්වර සංශෝධිත) යටතේ ස්ථාපිත කරන ලද රජයේ විශ්වවිද්‍යාල හෝ උසස් අධ්‍යාපන ආයතනයකට ප්‍රවේශ වීම සඳහා සුදුසුකම් නොලබයි.

    වසර තුනක් හෝ ඊට වැඩි කාලයක් සහිත පූර්ණකාලීන උසස් ජාතික ඩිප්ලෝමා (HND) පාඨමාලා

    (i) උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමාව - (HNDA)

    (ii) උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (සිවිල්) HNDE (Civil)

    (iii) උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (විදුලි හා විද්‍යුත් ) HNDE (Electrical & Electronics)

    (iv) උසස් ජාතික ඉංජිනේරු ඩිප්ලෝමාව (යාන්ත්‍රික) HNDE (Mechanical)

    (v) උසස් ජාතික ගොඩනැගිලි සේවා ඉංජිනේරු ඩිප්ලෝමාව (HNDBSE)

    (vi) උසස් ජාතික තාක්ෂණ (කෘෂිකර්ම) ඩිප්ලෝමා පාඨමාලාව (HNDT – Agriculture)

    (vii) උසස් ජාතික කළමනාකරණ ඩිප්ලෝමාව (HNDM)

    (viii) උසස් ජාතික සංචාරක හා සත්කාරක කළමනාකරණ ඩිප්ලෝමා පාඨමාලාව (HNDTHM)

03. පූර්ණ කාලීන පාඨමාලා සඳහා බඳවා ගැනීමේදී වයස අවුරුදු 23 ට අඩු අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ. එමෙන්ම, 2024 වර්ෂයේ අ.පො.ස.(උ:පෙළ) විභාගය සාර්ථක ලෙස සම්පූර්ණ කළ අයදුම්කරුවන්ට ද ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.

04. යම් උසස් තාක්ෂණ ආයතනයක නියමිත පාඨමාලාවක් ආරම්භ කිරීම සඳහා, එම අධ්‍යයන පාඨමාලාවට අවම වශයෙන් සිසුන් 50 ක් ලියාපදිංචි විය යුතුය. යම් පාඨමාලාවක් ආරම්භ කිරීමට ප්‍රමාණවත් ශිෂ්‍ය සංඛ්‍යාවක් නොමැති අවස්ථාවක, එම සිසුන් එම පාඨමාලාවම පවත්වනු ලබන ආසන්නම උසස් තාක්ෂණ ආයතනය වෙත ස්ථාන මාරු කරනු ලැබේ. මේ සම්බන්ධව අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ තීරණය අවසාන තීරණය වේ.

05. සියලුම පූර්ණ කාලීන පාඨමාලා හදාරන සිසුන්, සතියේ දිනවල සහ අවශ්‍ය වුවහොත් සති අන්ත දිනවල ද දේශන සඳහා සහභාගී විය යුතුය.

06. අර්ධකාලීන පාඨමාලා සති අන්තයේ පවත්වනු ලැබේ.

07. පූර්ණ කාලීන හා අර්ධ කාලීන පාඨමාලා පවත්වනු ලබන්නේ ප්‍රධාන වශයෙන් දේශනශාලාගතව (පන්ති මට්ටමින්) වේ. කෙසේ වෙතත් අවශ්‍යතාවය අනුව පන්ති කාමර තුළ දේශන පැවැත්වීම මෙන්ම මාර්ගගතව දේශන පැවැත්වීම ද සිදු කරනු ලැබේ.

08. උසස් ජාතික ගණකාධිකරණ ඩිප්ලෝමා (HNDA) (පූර්ණ කාලීන) පාඨමාලාවේ පළමු වසර හා දෙවන වසරවල අධ්‍යයන කටයුතු සතියේ දිනවල දී පමණක් පවත්වනු ලැබේ. මෙම පාඨමාලාවේ තුන්වන හා හතරවන වසර සඳහා වන දේශන සති අන්තයේ දී පැවැත්වේ.

09. පූර්ණ කාලීන පාඨමාලාවල සිසුන් අවම වශයෙන් මාස 06 ක කාලයක් අදාල ක්ෂේත්‍රයේ ප්‍රායෝගික පුහුණුවක් ලබා ගත යුතුය. අර්ධකාලීන සිසුන් අදාල ක්ෂේත්‍රයේ අවම වශයෙන් මාස 6 ක ව්‍යාපෘතියක්/ කර්මාන්ත පුහුණුවක් ලබාගත යුතුය.

10. අර්ධ කාලීන අයදුම්කරුවන් අදාල ක්ෂේත්‍රයේ රැකියාවක නිරතව සිටිය යුතුය.

**11. යම් සිසුවෙකු පූර්ණ කාලීන පාඨමාලාවකට තෝරාගැනීමෙන් පසුව වෙනත් කිසිදු උසස් තාක්ෂණ ආයතනයක් වෙත කිසිදු හේතුවක් මත ස්ථාන මාරු කරනු නොලැබේ.**

12. ඕනෑම උසස් ජාතික ඩිප්ලෝමා (HND) පාඨමාලාවක් සඳහා ලියාපදිංචි වී ඇති සිසුන්ට කිසිදු ගාස්තුවකින් තොරව අදාල ආයතනය විසින් ලබා දී ඇති ලියාපදිංචි වීමේ අවසන් දිනයේ සිට දින 60 ක් ඇතුලත ඔවුන්ගේ ලියාපදිංචිය අවලංගු කිරීමට අවසර දෙනු ලැබේ. ශිෂ්‍ය ලියාපදිංචිය සඳහා අවසාන දිනය පාඨමාලා සමාරම්භක/ ශිෂ්‍ය දිශානත වැටසටහනකට පෙර වේ.

13. (i) දින 60 කට පසුව ලියාපදිංචිය අවලංගු කරන සිසුන්ගෙන් රැදී සිටි කාලය සඳහා මසකට රු.5,000.00 ක් බැගින් අයකෙරේ. උපරිමය රු.30,000.00 ක් මාස හයක් හෝ ඊට වැඩි කාලයකට පසු තුල ලියාපදිංචිය අවලංගු කරන සිසුන්ගෙන් අයකෙරේ.

(ii) අර්ධකාලීන පාඨමාලාව සඳහා සිසුන් ලියාපදිංචි කිරීමේදී, රුපියල් 10,000.00 ක් ආපසු ගෙවිය හැකි මූලික මුදල් තැන්පතුව ලෙස අය කරනු ලබන අතර, එය පාඨමාලාව අවසානයේ ආපසු ගෙවනු ලැබේ. ශිෂ්‍යයා පාඨමාලාව අවසන් කිරීමට පෙර පාඨමාලාව හැර ගියහොත්, මෙම තැන්පතුව ආපසු ගෙවනු නොලැබේ. ලියාපදිංචියේ දී සම්පූර්ණ ගාස්තුව එකවර ගෙවන අර්ධකාලීන අයදුම්කරුවන් හට 10% ක වට්ටමක් ලබා දෙනු ඇත.

14. සතියේ දින වල සහ සති අන්ත දින වල පූර්ණ කාලීන හා අර්ධ කාලීන සිසුන් සඳහා සමාසික අවසාන වාර විභාග පවත්වනු ලැබේ.

15. අ.පො.ස (උ.පෙළ) සහ අ.පො.ස.(සා.පෙළ) විභාග පාලනය වී තිබිය යුත්තේ, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවෙනි.

16. අසත්‍ය තොරතුරු ඉදිරිපත් කර ඇති ඕනෑම අයදුම්කරුවකුගේ අයදුම්පත ප්‍රතික්ෂේප කරනු ලැබේ.

17. 2025 අධ්‍යයන වර්ෂය සඳහා උසස් තාකෂණ ආයතන වෙත සිසුන් ඇතුළත් කර ගැනීම සම්බන්ධයෙන්, ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්ගේ තීරණය අවසන් තීරණය වේ.

18. උසස් තාක්ෂණ ආයතනවල පවතින ආසන ධාරිතාව මත පදනම්ව බඳවා ගැනීම් සිදුකෙරේ.

19. මාර්ගගතව අයදුම්පත් යොමුකිරීමට පහසුකම් නොමැති සිසුන්ට එම සේවාව ලබාගැනීම සඳහා ලගම ඇති උසස් තාක්‍ෂණ ආයතනය වෙත පැමිණිය හැක.

20. අයදුම්කරුවන් විසින් උසස් තාක්ෂණ ආයතන සහඋසස් ජාතික ඩිප්ලෝමා පාඨමාලා සඳහා අයදුම් කිරීමේ දී තම පදිංචි ස්ථානයට ආසන්නතම උසස් තාක්ෂණ ආයතනය වෙත අයදුම් කිරීම සුදුසු වේ.

21. වැඩිදුර තොරතුරු සඳහා **www.sliate.ac.lk** වෙබ් අඩවියට පිවිසෙන්න.

**අයදුම්පත් භාරගන්නා අවසාන දිනය 2025 ජූලි 14 දින වේ.**

**අධ්‍යක්ෂ ජනරාල්**
**ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය**
**(SLIATE)**
**නො: 53 A**
**වෛද්‍ය පාර**
**දෙහිවල.**